# පරිසරය සහ සංවර්ධනය


## නීල් ප්‍රනාන්දු

ලේකම්, පාරිසරික සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය


**පසුබිම**

සංවර්ධනය පිළිබඳ අපගේ සංකල්ප සහ පුරුදු, මෑත කාලයේ දී අවධාරණය සහ අන්තර්ගත අතින් වෙනසකට භාජනය වී ඇත. මෙම වෙනසත් සමග සංවර්ධනය සහ පරිසරය අතර පවත්නා සම්බන්ධතාවය ද විපර්යාස වී ඇත. අවුරුදු හතළිහකට පෙර සංවර්ධනය යන වචනය "ආර්ථික වර්ධනය" යන වචනය හා සමාන අර්ථයෙන් යුක්ත විය. දළ ජාතික නිෂ්පාදනය වැඩිවීම නිසා දේශපාලන සහ පාරිසරික යන ගැටලු ස්වයංක්‍රීයව ම විසඳෙනු ඇතැයි විශ්වාස කරනු ලැබී ය. පරිසරය මූලික වශයෙන් ම නිෂ්කර්ශක සහ උපයෝගී වන්නේ ය යන මතයක් පැවැති අතර තාක්ෂණයේ වැඩි දියුණු කිරීම්වල මූලික අරමුණ වූයේ මෙයයි.

ආර්ථික වර්ධනය පමණක් ප්‍රමාණවත් නොවන බව තුන්වන ලෝකයේ රටවලට අවබෝධ වූ විට 'ආර්ථික සංවර්ධනය' පිළිබඳ සංකල්ප ප්‍රචලිත විය. ආර්ථික ක්‍රමයේ වර්ධනය සඳහා සංවිධානය පිළිබඳ වෙනස්කම් අවශ්‍ය යයි සළකන ලද අතර, වර්ධනයට පමණක් මෙම වෙනස්කම් ඇති කළ නොහැකි විය. ආර්ථික සංවිධානය, නිෂ්පාදන ක්‍රම, මිනිස් ශ්‍රමය උපයෝගී කර ගැනීම, තාක්ෂණය, වෙළෙඳ පොළ සහ රටේ ආර්ථික ව්‍යුහය පිළිබඳව ගුණාත්මක ස්වභාවයේ වැඩිදියුණු කිරීම්, සංවර්ධනය වන රටවලට අවශ්‍ය වන්නේ ය. එමෙන් ම පරිසරය 'උපරිම' මට්ටමින් උපයෝගී කර ගැනීම පිළිබඳ සංකල්ප වෙනස් වී 'ප්‍රශස්ත' මට්ටමින් උපයෝගී කර ගත යුතු ය යන අදහස් ඇති විය.

එසේ වුවද, සංවර්ධනය සහ එයත් පරිසරයත් අතරේ පවත්නා සම්බන්ධතාවය යන දෙකම පසුගිය අවුරුදු විස්ස තුළ තවදුරටත් වෙනස්වීම්වලට භාජනය විය. සංවර්ධනතාවය පිළිබඳ පැවැති දුෂ්කර තත්ත්වයන්, සත්‍ය ලෝකයේ අසාර්ථකත්වයන්ට හේතු විය. සංවර්ධනය යන්නට, ආර්ථික ක්‍රමය, ආණ්ඩු ක්‍රමය, සමාජය, සංස්කෘතිය පමණක් නොව පරිසරය අයත් වන්නේ යයි සළකන ලද අතර, දැන් සංවර්ධනය යන්නෙන් අදහස් වන්නේ එක් සාමාජික තත්ත්වයක සිට වැඩි වටිනාකමකින් යුත් තත්ත්වයක් දක්වා, සමාජයෙහි ගුණාත්මක ස්වභාවයෙන් යුත් විශාල වෙනසක් යයි තේරුම් ගත යුතු ය. එයට ව්‍යුහමය අන්‍යෝන්‍ය වශයෙන් ක්‍රියාත්මක වන්නා වූ සාමාජික, ආර්ථික, දේශපාලන සහ සෙසු වෙනස්කම් සහිත සංකීර්ණ ක්‍රියාවලියක් ඇතුළත් වන බව පෙනේ.

දැනට පැන නැගී ඇති දෙය නම්, විවිධ රටවල ද පවත්නා ඒ ඒ රටවලට සීමා වූ විෂමතාවන්, සංස්කෘතික සහ පාරිසරික සීමාවන් සහ ඒ රටවල සංවර්ධන අරමුණු ගැන සැළකිල්ලක් දක්වන, සංවර්ධනය පිළිබඳ සාපේක්ෂමය සංකල්පයකි. සංවර්ධනය වෙත විවිධ මාර්ග වලින් ළඟා විය හැකි අතර, මේ අනුව ඒවා ඒ ඒ සමාජයට සහ ඒවායේ අරමුණුවලට විශේෂිත වන්නේ ය. වැඩීම සම්බන්ධ සීමාවන් ද, පරිසරය සහ ස්වාභාවික සම්පත් සීමාවකින් තොරව උපයෝගී කර ගැනීමෙන් ඇති විය හැකි විපත්තිය ද, 'රෝමා' සමාජයේ මුල් කාලීන වාර්තා මගින් වැදගත් කොට දක්වනු ලැබී ය. 1970 ගණන්වල මැද භාගයේ දී ඩැග් හැමර්ෂෙල්ඩ් පදනම විසින් 'තවත් සංවර්ධනයක්' යන පාඨය ප්‍රචලිත කළ අවස්ථාවේ දී ඔවුන් අනුමත කළේ ජෛවගෝලයේ සම්පත් පාවිච්චි කිරීමේ දී සංවර්ධනය පරිසර විද්‍යාත්මකව ස්ථිරසාර විය යුතු බව සහ එබඳු සම්පත්වලට හැමදෙනාට ම ස්වේච්ඡා ප්‍රවේශයන් තිබිය යුතු බවත් ය. මේ ආකාරයට පසුගිය අවුරුදු පහළොව තුළ දී ම පරිසරය පිළිබඳ කරුණු දක්වන ලෝකයේ රටවල සංවර්ධන ප්‍රතිපත්ති වැඩි වැඩියෙන් ඇතුළත් කර ඇත.



**වෙනස්වන අර්ථයේ පදනම**

පරිසරය සහ සංවර්ධනය අතරේ පවත්නා සම්බන්ධතාවය පිළිබඳ අවබෝධ ප්‍රතිපත්ති සහ පුරුදු පිළිබඳ මෙම වෙනස්කම්වලට හේතු රාශියක රැකුල ලැබී ඇත. සංවර්ධනය පිළිබඳ මත සහ සංවර්ධනය හා සෙසු සාධක අතර සම්බන්ධතාවය, සාක්ෂි මත පදනම් විය යුතු අතර, ඒවා එක් රැස්වීමට කාලයක් ගත වේ. අවස්ථානුගත ප්‍රමුඛතාවක් යම් නිශ්චිත අවස්ථාවක දී ඇති ගැටළු, කලින් මතවල පිළිබිඹු වෙයි. තුන්වන ලෝකයේ සංවර්ධන අසාර්ථකවීම නිසා, සංවර්ධනය සහ පරිසරය අතරේ නව සම්බන්ධතාවක් සඳහා මඟ විවෘත වී ඇත.

මූලික වශයෙන් ම මෙම වෙනස් කිරීම් වලට ප්‍රධාන හේතුවක් වූයේ සංවර්ධනය, "නවීකරණය" ලෙස සිතා ගැනීමේ දී ඇති වූ ව්‍යාකූලත්වයයි. සංවර්ධනය පිළිබඳ මුල් කාලීන අර්ථයන් නවීකරණ ආදර්ශයන් මත පදනම් වූ අතර, එහි දී සංවර්ධනය වන රටවල් කළේ උතුරු අත්ලාන්තික් ප්‍රදේශයේ පැවැති සංවර්ධන ක්‍රම අනුගමනය කිරීමයි. කෙසේ වුවද, මෙය ඉතිහාසයට ගැනීම නිසා හටගත් මිථ්‍යාවක් වෙයි. ඊට හේතුව ඓතිහාසික ක්‍රියාදාමයක් එකම ආකාරයට නැවත ඇති නොවීම ය. කාර්මික සහ නාගරික සංවර්ධනය මගින් ඇති නවීකරණය පිළිබඳ මුල් කාලීන බටහිර ආදර්ශයන්, අද තුන්වන ලෝකයේ නැවත ඇති කළ නොහැකි වන්නේ ය. බටහිර රටවලට කර්මාන්ත, මෙම (තුන්වන ලෝකයේ) රටවලින් සපයන ලද අමු ද්‍රව්‍ය මත පදනම් ව තිබීම ඊට හේතුවයි. බටහිර රටවල තාක්ෂණ ක්‍රම වෙළෙඳ සහ බහු ජාතික සමාගම් විසින්, යටත් විජිතවාදී සහ නව යටත් විජිතවාදී ආධිපත්‍යය මගින්, එම රටවල නවීකරණය නම් වූ ඇන්ජින් සඳහා 'ආහාර සහ ඉන්ධන' පිණිස, තුන්වන ලෝකයේ රටවල පරිසරයේ සම්පත් තම ප්‍රයෝජනයට අනිසි ලෙස යොදා ගනු ලැබී ය. ඒ හේතුවෙන් ප්‍රතිසම්පාදනය කළ නොහැකි සම්පත් ක්ෂය වීම සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූ වෙනත් ආකාරවල පරිසරය කෙළෙසීමේ ක්‍රම පිළිබඳ සාමාජික සහ ආර්ථික පිරිවැය සංවර්ධනය බවට පත් වූයේ කුමක් ද යන්න

පිළිබඳ මුල් කාලීන අර්ථවලදී ගණන් ගනු ලැබුවේවත් අවධාරණය කරනු ලැබුවේවත් නැත. නවීකරණය පිළිබඳ බටහිර රටවල ආදර්ශයන්, පරිසරය පාලනය සංරක්ෂණය සහ සංවර්ධනය පිළිබඳ නව සම්බන්ධතාවත්, සංවර්ධනය සඳහා තුන්වන ලෝකයේ රටවල ඇති වූ ස්වදේශීය උනන්දුව අනුව, එම රටවල ප්‍රතිපත්තිවල සහ වැඩ සටහන්වල කොටස් බවට පත් විය. බටහිර රටවල සම්පත් පරිභෝජනය පිළිබඳ සූක්ෂම රටා, අළුතින් සංවර්ධනය වන රටවල ඒ ආකාරයෙන් ම ඇති කිරීම ද කළ නොහැක.

මෙම නව අර්ථයන්ට වෙනත් සාධක ද හේතු විය. හැත්තෑ ගණන්වල දී ඇති වූ තෙල් මිල වැඩිවීම හේතුවෙන්, ප්‍රතිසම්පාදනය කළ නොහැකි සම්පත්වල වටිනාකමත්, අගයත් පැහැදිළි විය. සංවර්ධනය පිළිබඳ සීමාවන්ට අවසාන වශයෙන් හේතුවන, අපගේ ජෛව ගෝලයේ ඇති වෙනත් ආකාරවල ස්වභාවික සම්පත් පිළිබඳ සැපයුම සහ ඉල්ලුම පිළිබඳ මධ්‍ය සහ දිගු කාලීන අසමතුලිතාවන් වැදගත් කම එම තෙල් මිල වැඩි වීමෙන් පැහැදිළි විය. දකුණු සහරාව කාන්තාරයක් බවට පත්වීම සහ තුන්වන ලෝකයේ සෙසු රටවල සිදු වන ස්වභාවික ව්‍යසනයන් වැනි පාරිසරික අසමතුලිතතාවයන් සම්බන්ධ බරපතළ ගැටළු මගින් රටවල් කීපයක පරිසරයේ දුර්වලතාවය සහ අනතුරට පත්විය හැකි බව අවධාරණය කරනු ලැබී ය. ජනගහණයේ සීඝ්‍ර වර්ධනය, මහා පරිමාණ දරිද්‍රතාවය සහ අකුරු නො දැනීම ද දියුණු වන රටවල් රැසියක පරිසරය සීඝ්‍රයෙන් පිරිහී යාමට හේතු විය.

අයෝග්‍ය තාක්ෂණය නිසා ජෛවගෝලයට සිදු වූ අතුරු බලපෑම් ද පර්යේෂණවල දී එළිදරව් වී ඇත. (කෘෂි කර්මාන්තයේ දී යොදා ගනු ලබන පළිබෝධ නාශක සහ රසායනික සංයෝග උදාහරණ ලෙස දැක්විය හැක්කේ ය.) පෘතුවිය එකම 'අභ්‍යවකාශ යානයක් ද' මනුෂ්‍ය වර්ගයාට 'පොදු අනාගතයක්' ඇත්තා වූ භූමියට ද සළකනු ලැබී ය. පෘතුවි ගෝලය රත්වීම, දේශගුණික වෙනස්වීම්, ඕසෝන් ස්ථරය පිරිහී යාම, මුහුදු මට්ටම ඉහළ නැඟීම සහ වෙනත් විභව පාරිසරික ව්‍යසනයන් නිසා ද පරිසරය පිළිබඳ ප්‍රශ්න, සංවර්ධනය සම්බන්ධ විවාදයේ ඉදිරියට තල්ලු වී ආවේ ය. මේ නිසා පරිසරය පිළිබඳ අපගේ අවබෝධ යේත්, යන් සංවර්ධනයත් අතරේ ඇති (සහ ප්‍රතිලෝම) සම්බන්ධතායේත් අළුත් පුරුක් ඇති වෙයි. 'සංවර්ධන දශක' නව අන්තර් ජාතික ආර්ථික ක්‍රමය සහ වෙනත් සමස්ත ලෝක 'ප්‍රතිකර්ම' බිඳ වැටීමත් සමග ම, තුන්වන ලෝකයේ රටවල සංවර්ධන ප්‍රතිපත්ති සහ වැඩ සටහන් යන සන්දර්භය තුළ, එම රට වල පරිසරය සකසුරුවමින් යොදා ගැනීම සහ පාලනය කිරීම සම්බන්ධව ආත්ම විශ්වාස යෙන් යුත් ප්‍රවේශයන්ගේ අවශ්‍යතාවය එම රටවල්වලට ඒත්තු ගන්වනු ලැබ ඇත්තේ ය. එනෙකුදු වුව ද මෙම දුෂ්කර ව්‍යාපාරවල ප්‍රතිඵල යක් වශයෙන් ඇති වූ නුරුස්සන බව නිසා සංවර්ධනය පරිසරය කෙරේ සහ ඒවා අතර සම්බන්ධතාවය කෙරේ ඇති කළ බලපෑම තක්සේරු කිරීමේ දී වැඩි යථාර්ථයකට හේතු වී ඇත.

**පවත්වා ගෙන යා හැකි සංවර්ධනය (Sustainable Development (SD)**

1987 වර්ෂයේ බ්‍රන්ට්ලන්ඩ් කොමිෂන් සභාවේ ප්‍රධාන ප්‍රතිපත්ති ඉලක්කය 'පවත්වා ගෙන යා හැකි සංවර්ධනය' වූ අතර, එමගින් පරිසරය පිළිබඳ ප්‍රතිපත්ති සංවර්ධන උපාය මාර්ග සමග ඒකාබද්ධ කිරීම සමග රාමුවක් සළස්වනු ලැබී ය. අනාගතය අනතුරේ හෙළී මෙන් තොරව, වර්තමාන අවශ්‍යතාවන් සපුරා ලීමට එමගින් උත්සාහ කරන ලදී. ආර්ථික වර්ධනය. රහිත පරිසර විද්‍යාත්මක මූලයන් හා සම්බන්ධ විය යුතු අතර, දීර්ඝ කාලීන වර්ධනයට රුකුල් ලැබීම පිණිස එම මූලයන් ආරක්ෂා කොට පෝෂණය කළ යුතු ය. පවත්වා ගෙන යා හැකි සංවර්ධනය පිළිබඳ දෙයා කාරයක ගැටළු ඇත්තේ ය. දුගී ජනතාවගේ මූලික අවශ්‍යතාවන් කෙරෙහි දැඩි අවධානයක් යොමු කිරීම සහ වර්තමාන සහ අනාගත අවශ්‍යතාවන් සපුරාලීමට පරිසරයට ඇති හැකියාව කෙරේ ඇති වී තිබෙන සීමාවන් පිළිබඳ අවබෝධය එම ගැටළු ය. ඒ සඳහා, පරිසර විද්‍යාත්මකව ඇති කරගත හැකි වටිනාකම සහ පරිභෝජන සම්මතයන් වර්ධනය කිරීමක් අවශ්‍ය වන්නේ ය.

පෘතුවි තලයේ ජීවනයට රුකුල් ලබාදෙන වාතය, ජලය, පස සහ ජීවීන් යන ස්වභාවික ක්‍රම, පවත්වාගෙන යාහැකි සංවර්ධනය මගින් අනතුරට නොහෙළිය යුතු ය. වැඩිවන වියදම් හෝ යම් සම්පතක් පිළිබඳ හීනවන එලදාවන් සඳහා ප්‍රතිකර්ම පියවර ගැනීම අවශ්‍ය විය හැකි ය. ප්‍රතිසම්පාදනය කළ හැකි සම්පත් බෙහෝමයක් ම සංකීර්ණ වූත්, එකිනෙක සම්බන්ධ වූත් පරිසර පද්ධතියක කොටසක් වන හෙයින්, පවත්වා ගෙන යා හැකි උපරිම ඵලය කෙතෙක් දැයි නියම කළ යුත්තේ, සම්පත් උපයෝගී කර ගැනීමේ විවිධ ක්‍රම කෙරෙහි ඇතිවන ප්‍රතිඵල සොයා දැන ගැනී මෙන් පසුව ය. එමනිසා පවත්වා ගෙන යා හැකි සංවර්ධනය යනු සම්පත් උපයෝගී කරගැනීම, ආයෝජනය මෙහෙයවීම, තාක්ෂණික සංවර්ධනය යොමු කිරීම, ආයතනික වෙනස් කිරීම් යන සියල්ලක් ම එකමුතුව පවත්නා වූ සහ මානව අවශ්‍යතාවන් සහ අපේක්ෂාවන් සපුරාලීම සඳහා වර්තමාන සහ අනාගත යන දෙයාකාරයේ ම ශක්තිය වැඩි කෙරෙන්නා වූ වෙනස්කම් ඇති කෙරෙන ක්‍රියා මාලාවක් හැටියට සළකනු ලැබේ.

පවත්වා ගෙන යා හැකි සංවර්ධනයක් සාක්ෂාත් කර ගැනීම පිණිස උපාය මාර්ග විධි ගණනක් හඳුනාගනු ලැබ ඇත්තේ ය. ඒවා නම් :-

* පරිසරයට කෙරෙන සම්පීඩන, දුගීභාවය මගින් වැඩි කෙරෙන අතර, එමගින් ස්ථිර ආකාරයට සම්පත් පාවිච්චි කිරීමට ජනතාවට ඇති හැකියාව අඩුවේ යයි පිළිගනු ලැබ ඇත. ඔවුන්ගේ අවශ්‍යතා වන් සපුරාලීම පිණිස වර්ධනය පනගැන්විය යුතුව ඇත.
* වර්ධනයේ ගුණාත්මක භාවයේ සහ ප්‍රමාණයේ ද්‍රව්‍ය සහ බලශක්ති සූක්ෂම බව අඩු කළ යුතු අතර, එහි බලපෑම සාධාරණ බවට පත් කළ යුතු ය. මෙසේ කිරීම පරිසර ප්‍රාග්ධන තොගය පවත්වා ගෙන යෑම, ආදායම බෙදීයාම් වැඩි දියුණු කිරීම සහ ආර්ථික අර්බුදයකට පාත්‍රවීමට ඇති ඉඩකඩ අඩු කිරීම සඳහා හැම රටකම සිදු විය යුතු ය.
* සංවර්ධනය පිළිබඳ ප්‍රධාන අභියෝගය වනුයේ, වර්ධනය වන ජනගහණයේ අවශ්‍යතාවන් අපේක්ෂාවන් සපුරාලීම හැටියට හඳුනාගෙන ඇත. ජනතාව පෝෂණය කිරීමට, මන්ද පෝෂණය සහ ප්‍රෝටීන් ඌනතාවය පිටු දැකීමට වඩ වඩා ආහාර අවශ්‍ය වෙයි. පාරිසරිකව වැදගත් වන සෙසු මූලික අවශ්‍යතාවන් වනුයේ බලශක්තිය, නිවාස, ජල සැපයුම, සනීපාරක්ෂාව සහ සෞඛ්‍ය ප්‍රතිකාරයි. පවත්වා ගෙන යාහැකි සංවර්ධනය මගින් අත්‍යාවශ්‍ය මානව අවශ්‍යතාවය සපුරා ලිය යුතු ය.
* ජනගහණයේ ප්‍රමාණය, පරිසරය පද්ධතියේ නිෂ්පාදන හැකියාවට ගැළපෙන මට්ටමක ස්ථායීව තැබූ විට පවත්වා ගෙන යාහැකි සංවර්ධනය ශක්‍ය විය හැකි ය. මේ අනුව පවත්වාගෙන යාහැකි ජනගහණ මට්ටමක් ඇතිවන බවට සහතික විය යුතු ය.
* පෘතුවියේ ස්වභාවික සම්පත් පදනම සංරක්ෂණ කොට වැඩි දියුණු කළ යුතු ය. දැනට උසස් මට්ටමක පවත්නා පරිභෝජනය, අනාගත ජනගහණ වර්ධනය සහ තුන්වන ලෝකයේ මූලික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා වැඩිවන පරිභෝජනය ජය ගැනීම සඳහා කාර්මික ලෝකයේ ප්‍රතිපත්තිවල වෙනස්කම් සිදු විය යුතු ය. පවත්වා ගෙන යා හැකි ආදායමක් උපයා ගැනීමට ජනතාවට ඇති අභිමතය පුළුල් කළ යුතු ය.
* පාරිසරික වශයෙන් වාසිදායක වන පරිදි තාක්ෂණය නැවත යොමු කළ යුතු ය. මේ සඳහා වෛකල්පිත තාක්ෂණ වර්ධනය කළ යුතු අතර, සාම්ප්‍රදායික තාක්ෂණය උසස් මට්ටමට පත් කළ යුතු ය.
* ප්‍රතිපත්ති තීරණයක් කිරීමේ දී පාරිසරික සහ ආර්ථික කරුණු එකට මුසු කොට ගත යුතු ය. මේ සඳහා හැම මට්ටමකදී ම ආකල්ප, අරමුණු පිළිබඳව සහ ආයතනික විධිවිධාන පිළිබඳව වෙනස් කම් ඇති කිරීම අවශ්‍ය වේ.

දේශපාලන තීරණ ගැනීමට, පුරවැසි සහභාගිත්වය ලබා ගැනීමෙන් පවත්වාගෙන යාහැකි පදනමක් මත ආර්ථික අතිරික්තයන්

සහ තාක්ෂණය උපදවා ගැනීමෙන්, විෂම සංවර්ධනයක් ඇතිවන සාමාජික ගැටුම් විසඳා ගැනීමෙන් සහ පරිසරය සංරක්ෂණය කෙරෙන නිෂ්පාදන ක්‍රම, නව විසඳුම් ලබා දෙන තාක්‍ෂණය, වෙළෙඳාම සහ මුදල් පිළිබඳව පවත්වා ගෙන යාහැකි ක්‍රම පෝෂණය කරන අන්තර් ජාතික ක්‍රමයක් සහ න්‍යාය වූ සහ ස්වයං නිවැරදි කාරක පරිපාලන ක්‍රමයක් මගින්, පවත්වා ගෙන යාහැකි සංවර්ධනයේ අරමුණු නංවාලිය හැකිවන බවට ද තර්ක කරනු ලැබී ය.

පවත්වා ගෙන යාහැකි සංවර්ධනය පිළිබඳව, බ්‍රන්ලන්ඩ් කොමිෂන් සභාවේ මෙම මත වලට ද, උතුර-දකුණු සම්බන්ධතාවන් පිළිබඳ බ්‍රාන්ට් කොමිෂන් සභාවට ලැබුණු තරම් අන්තර් ජාතික ප්‍රචාරයක් ලැබුණි. එතෙකුදු වුවද, වෙනු කී අවස්ථාවේ දී මෙන් 1989 න් පසුව ගන්නා ලද ස්ථිර පියවර, පරිසර සම්පත් පවත්වා ගෙන යා හැකි බව යන සංකල්පය කෙරෙහි අන්තර් ජාතික සමාජය විසින් දක්වන ලද ප්‍රණාමයට අසතුටුදායක වන තරමට ම ප්‍රමාණානුකූල නොවේ. එතෙකුදු වුවද, තුන්වන ලෝකයේ රටවල්වල සංවර්ධන ප්‍රතිපත්ති සහ වැඩ සටහන් සකස් කිරීමේ දී මෙන්ම, තම පරිසරය සංරක්‍ෂණය කිරීම සහ සමස්ත ලෝක පරිසර දූෂණය මැඩ පැවැත්වීම පිණිස කාර්මික රටවල් තුළ 'කොළ කණ්ඩායම්' සහ වෙනත් උද්ඝෝෂණ කණ්ඩායම් ක්‍රියාත්මක කරවීමේ දී පරිසරය සම්බන්ධ ව්‍යාපාර ඒකාබද්ධ කිරීමේ අවශ්‍ය තාවය එම වාර්තාව විසින් වැදගත් කොට දක්වන ලදී.

මෙම වාර්තාව සම්බන්ධ සවිස්තර ඇගයීමක් කිරීමට අදහස් නොකරන නමුත්, ඒ පිළිබඳ අදහස් සහ නිරීක්ෂණ කීපයක් කිරීම ප්‍රයෝජනවත් විය හැකි ය. පවත්වා ගෙන යාහැකි සංවර්ධනයක් සඳහා, ආණ්ඩු ක්‍රමය, ආර්ථිකය, තාක්ෂණ, ජනගහණ වැඩ සටහන්, නිෂ්පාදන ක්‍රම අන්තර් ජාතික සහයෝගය සහ පරිපාලන ක්‍රම යන ක්ෂේත්‍ර කිහිපයක මෙහෙයුම් සංකීර්ණත්වයක් සහ දුෂ්කරතාවන් ඇති කෙරෙන අනුපූරක ක්‍රියා වල සංයෝගයක් අවශ්‍ය වන්නේ ය. පවත්වා ගෙන යාහැකි සංවර්ධනයක් ක්‍රියාත්මක කිරීමේ දී අරමුණ සහ එකඟත්වය පිළිබඳව ඒකමතිකත්වයක් ඇති ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ සහ තීරණ ගැනීම් ප්‍රබුද්ධ ජනතාවක් බොහෝ රටවල නැත්තේ ය. විකල්ප තෝරා ගැනීමත්, නොමැතිවීම නිසා ප්‍රශස්ත පාරිසරික මාවතේ ගමන් කිරීමක් සිදු නොවිය හැකි ය. විශාල ව්‍යාපාරවල, දුගී කණ්ඩායම්වල සහ සෙසු අයගේ සම්බන්ධතාවන්ගේ ගැටුම් නිසා මෙම ගැටළු සංකීර්ණ බවට පත් කෙරෙයි. දේශපාලන ක්‍රමයන් ලැබිය යුතු ආධාර ද නොතිබිය හැකි ය. විශේෂයෙන් ම දේශපාලන ප්‍රබුද්ධ කණ්ඩායම පුළුල් පදනමකින් යුක්ත වන්නේ නම්, තෘප්ත කළ නොහැකි ප්‍රතිවිරුද්ධ ඉල්ලීම් විශාල සංඛ්‍යාවක් තිබෙන්නට පුළුවන. ඉක්මන් කාලීන ප්‍රතිලාභ අපේක්ෂා කරන අවාසි යට ලක්වූ කණ්ඩායම් අතරේ පවත්නා නොසන්සුන්තාවය සහ ආත්‍යන්තීය හා නිර්මාණය පිළිබඳ වෙනස්කම් සිදු කිරීම පිළිබඳ ගැටළු හේතුකොට ගෙන ප්‍රතිපත්ති සහ වැඩ සටහන් තවදුරටත් ව්‍යාකූල බවට පත් වේ. පරිපාලන ක්‍රම ඌන සංවර්ධනයකට තිබීම, තුන්වන ලෝකයේ බොහෝ රටවල විශේෂ ලක්ෂණයක් වන හෙයින්, පවත්වා ගෙන යාහැකි සංවර්ධන ක්‍රියාත්මක කිරීම පිණිස කාර්යක්ෂම පරිපාලනයක් ද නොතිබිය හැකි ය. එබඳු අවස්ථාවලදී ඇති වනු ප්‍රශ්නය වනුයේ, පවත්වාගෙන යාහැකි සංවර්ධනයේ යෝග්‍යතාවය නොව, එය කොතරම් සත්‍ය වන්නේ ද යන බව සහ එය ක්‍රියාත්මක කළ හැක්කේ කෙසේ ද යන්නයි.

පරිසරය අනුව සළකන විට, ස්ථාවරවූත්, පවත්වාගෙන යාහැකි වූත් සංවර්ධනය සඳහා වූ උපාය මාර්ග සහ වැඩ සටහනේ සාකච්ඡා කිරීම පිණිස, එස්කැප් රටවල පරිසරය භාර ඇමතිවරුන්ගේ සම්මන්ත්‍රණයක්, මුලකුරු සෑදූ නම් ගැන අභිරුපයක් දක්වන එස්කැප් ක්‍රමය විසින් පවත්වනු ඇත. ඇතැම් අංශවලින් බලන විට, මෙම රැස්වීමට මඟ හෙළි කරන තේමාවන් එස්කැප් රටවල පාරිසරික තත්ත්වයට අදාළ කළ බ්‍රන්ට්ලන්ඩ් වාර්තාවෙන් පැන නගියි. වර්තමාන සහ අනාගත අවශ්‍යතාවන් සපුරාලීම සඳහා ද, සම්පත් කාර්යක්‍ෂමව සහ සාධාරණව පාවිච්චි කිරීමෙන් ජනතාවගේ මූලික අවශ්‍ය තාවන් සපුරාලීම සඳහා ද, සම්පත් ස්වභාවික සම්පත් පදනම කළමනාකරණය කිරීම ද, පරිසරය අනුව සළකන විට ස්ථාවරවූත් පවත්වා ගෙන යාහැකි වූත් සංවර්ධනයට ඇතුළත් වෙයි. එම නිසා එමගින් එක් අතකින් අනුප්‍රාප්ත වන පරම්පරා වන් අතරේ සම්පත් සාධාරණව පවත්වා ගෙන යැමත් අනෙක් අතට සමාජය තුළ දුගී කණ්ඩායම් වෙත පරිසරයේ වාසි බෙදාදීම පිළිබඳ සාධාරණත්වයක් සහ ජාතීන් අතරේ සාධාරණත්වය සහතික කිරීමක් අවධාරණය කෙරේ.

පරිසරය අනුව සළකන විට ස්ථාවරවූත් පවත්වා ගෙන යාහැකි වූත් සංවර්ධනය සඳහා ප්‍රමුඛත්ව ප්‍රතිපත්ති අංශ දහයකින් සමන්විත වන කලාපීය උපාය මාර්ගයක් ආසියා-ශාන්තිකර කලාපයේ යොදා ගැනීම සඳහා හඳුනාගනු ලැබ ඇත.

* පසුගිය පිරිහීයාමේ හේතුව සහ ඵලය යන දෙකම දුගීතාව වන හෙයින්, දුගී භාවය තුරන් කිරීම සහ මූලික අවශ්‍යතාවන් සපුරාලීම ඉතා වැදගත් වේ. ගොවිජන සේවා ප්‍රතිසංස්කරණ, ස්වභාවික සම්පත් කළමනාකරණය, සමාජ ප්‍රයත්නයන් සමග ඒකාබද්ධ කිරීම, කෘෂිකර්මය සහ අදාළ කර්මාන්ත වැඩි දියුණු කිරීම පිණිස උප ව්‍යුහයට සහ තාක්ෂණයට රුකුල්දීම සහ වෙළෙඳාම සහ ආධාර රටාව වැඩි දියුණු කිරීම.
* පාලනය නොකළ ජනගහණ වර්ධනය නිසා හීනවන සම්පත්වලට ඇති ඉල්ලුම වැඩිවීමට හේතුවන හෙයින්, ජනගහණය සහ පවුල් සංවිධානය ප්‍රතිපත්ති අවශ්‍ය වන්නේ ය. ජන සංඛ්‍යාවන් ද සංවර්ධන කටයුතු ව්‍යාප්ත කිරීමේ මාර්ගයෙන් ජනගහණයේ ප්‍රාදේශීය ව්‍යාප්තිය ද උපාය මාර්ග මගින් පාලනය කළ යුතු ය. අධ්‍යාපනය, සෞඛ්‍යය වැඩි දියුණු කිරීම ද, ස්ථාවර සාමාජික වටිනාකම් සකස් කිරීම ද, කාන්තාවන්ගේ සාමාජික සහ ආර්ථික වර්ධනය කෙරෙහි වඩා ප්‍රබල අවධාරණයක් කිරීම ද කළ යුතු යයි නිර්දේශ කරනු ලැබේ.
* සම්පත්, නිෂ්පාදන වත්කම් හැටියට පිළිගැනීම පිණිස ජාතික සම්පත් ගණන් බැලීමේ ක්‍රම යොදා ගත යුතු අතර, ඒවා ක්ෂයවීම, නිෂ්පාදිත භාණ්ඩ හා සේවා මිල කිරීමේ දී දැක්විය යුතු ය. පවත්වා ගෙන යාහැකි දළ ජාතික නිෂ්පාදනය ප්‍රමාණ කොට දැක්වීමට එසේ සම්පත් ගිණුම් ගත කිරීම ආධාර වනු ඇත. ස්වභාවික සම්පත් මිල කිරීම, පාරිසරික වැය සහ පාරිභෝගික වැය පිළිබිඹු වන පරිදි සකස් කළ යුතු ය.
* අමු ද්‍රව්‍ය දේශීය ව සකස් කිරීමට වඩා, ඒවා ආනයනය කිරීම් කෙරෙහි වැඩි කැමැත්තක් ආනයනය කරන රටවල් දක්වන නිසා වෙළෙඳම සහ ආයෝජන පුරුදු වෙනස් කළ යුතු ව ඇත්තේ ය. මෙම අනුකූලතාවය, බහු පාර්ශ්වික වෙළෙඳ සාකච්ඡා සහ වෙළෙඳ ද්‍රව්‍ය ස්වාධිකරණ අරමුදලේ පිහිටුවීම මගින් නිවැරදි කළ යුතු ය. විදේශ ආයෝජන ව්‍යාපාර විසින් පරිභෝජනය කරනු ලබන ස්වභාවික සම්පත් පවත්වා ගෙන යාහැකි බව කෙරෙහි ඇති වන මධ්‍ය කාල සහ දීර්ඝ කාල බලපෑම් සම්බන්ධයෙන්, විදේශික ආයෝජන ද අගය කළ යුතු ය.
* සීඝ්‍ර නාගරික කරණය හේතුකොට ගෙන මූලික නගර ප්‍රසාරණය වී ඇති අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් නාගරික තදබදය, පාරිසර දූෂණය සහ ඝන අප ද්‍රව්‍ය පාලනය පිළිබඳ ගැටළු උප ප්‍රමාණික නිවාස, වැඩි බදු අය කෙරෙන සාමාජික සහ භෞතික උප ව්‍යුහ ඇති වී තිබේ. නාගරීකරණය සෙසු මධ්‍ය ප්‍රමාණ නගර වලට විමධ්‍යගත කිරීම ද විධිමත් නොවන අංශයේ රැකී රක්ෂා උත්පාදනය, නාගරික උපව්‍යුහයන්ට වැඩි ආයෝජන සහ පැතිරීමේ සමාරණත්වය සහතික කෙරෙනු වස් නාගරික සහ ග්‍රාමීය සංවර්ධනය ඒකාබද්ධ කිරීමේ පියවර ද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට ඇතුළත් විය යුතු ය.
* සීඝ්‍ර කාර්මිකකරණයේ ප්‍රතිඵල වශයෙන් සම්පත් අඩුවී යාම, පරිසර දූෂණය අපතේ යාම, සෞඛ්‍යයට හානි පැමිණීම ආදිය ඇති වී තිබේ. උපාය මාර්ගය විය යුත්තේ, හැම කර්මාන්තයක් ම අපතේ යාම අඩු හෝ අපතේ යාමක් නැති තාක්ෂණික ක්‍රම යොදා ගනිමින් සම්පත් පදනම් කරගත්

30 පිටුවට.

